# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022 ජූනි 12 |


# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2022 අප්‍රේල්

## සමස්ත නිරීක්ෂණ

2022 වසරේ අප්‍රේල් මාසයේ දී ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අඛණ්ඩව දෙවන මාසයටත් අඩු වීමක් වාර්තා කළ අතර, අපනයන ඉපැයීම් ඉහළ ගියේය. රේගුවෙන් ලද මූලික දත්තවලට අනුව, ආනයනවල අඩුවීම 2022 වසරේ මැයි මස තවදුරටත් ශීඝ්‍ර වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, සංචාරක පැමිණීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර මාසයට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, විදේශීය ජංගම ගිණුමේ ස්ථායීතාවයට සහය දක්වමින් 2022 මැයි මාසයේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ යළි ඉහළ ගියේය. 2022 වසරේ අප්‍රේල් මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත විදේශ ආයෝජනයන්හි සුළු ශුද්ධ ලැබීම් වාර්තා විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළේ අඛණ්ඩ පීඩනය සැලකිල්ලට ගනිමින්, අවිධිමත් වෙළඳපොළේ ක්‍රියාකාරකම් සීමා කිරීමට සහ නිල සහ අවිධිමත් වෙළඳපොළ විනිමය අනුපාතික අතර පරතරය අඩු කිරීමට උපකාරී වූ විවෘත ගිණුම් සහ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම මත සිදුකල ආනයනයන් සීමා කිරීම් ඇතුළු ක්‍රියාමාර්ග 2022 වසරේ මැයි මාසයේදී මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. තවද, පෙර දින අන්තර් බැංකු වෙළඳපොළේ තීරණය වූ විනිමය අනුපාතිකය මත පදනම්ව, මහ බැංකුව විසින් 2022 වසරේ මැයි මස 13වැනි දින සිට සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවලට විචලන මට්ටම (දෙපසටම අදාළ විචලන සීමා ඉඩ හැරීම් සමඟ) පිළිබඳව දෛනික මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාමාර්ග හේතුවෙන් විනිමය අනුපාතිකයේ ස්ථාවරත්වය වර්ධනය වී ඇත..

### සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2021 අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | 2022 අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2021 ජන. - අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | 2022 ජන. - අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 818 | 970 | 18.5 | 3,800 | 4,219 | 11.0 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,707 | 1,699 | -0.5 | 6,748 | 7,350 | 8.9 |
| වෙළඳ ශේෂය | -889 | -729 | | -2,948 | -3,131 | |
| සංචාරක ඉපැයීම් | 11 (ආ) | 113 (ඇ) | - | 36 (ආ) | 626 (ඇ) | - |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 519 | 249 | -52.0 | 2,386 | 1,031 | -56.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -16 | 2 | | -107 | 92 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 566 | 342 | | 933 | 907 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 0.1 | 4 | | 8 | 9 | |
| දිගුකාලීන ණය | 66 | 338 | | 425 | 898 | |
| ඒකාබද්ධ ණය පහසුකම | 500 | - | | 500 | - | |
| සමස්ත ශේෂය | | | | -929 | -2,569 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2022 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ භාණ්ඩ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය:** හදිසි නොවන ආනයන අධෛර්යමත් කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී අඛණ්ඩව සිව්වන මාසයටත් වෙළඳ හිඟය මාසික ලක්ෂ්‍යමය පදනම මත පහළ යෑමක් වාර්තා කළේය. වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 889ක හිඟයට සාපේක්ෂව, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 729ක් දක්වා පහළ ගියේය. කෙසේ වුවද, 2022 වසරේ ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,948 සිට එ.ජ. ඩොලර් මිලියන 3,131ක් දක්වා පුළුල් විය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟය පුළුල් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී සියයට 10.6කින් පහළ ගිය අතර, අපනයන මිල ගණන් ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2022 වසරේ ජනවාරි - අප්‍රේල් කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (අගය එ.ජ. ඩොලර් මිලියනවලින්)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2021-2022)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2021-2022)**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**සමස්ත අපනයන: 2022 වසරේ අප්‍රේල් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, එ.ජ. ඩොලර් මිලියන 970ක් දක්වා 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව සියයට 18.5කින් වර්ධනය විය.** කාර්මික අපනයන සහ කෘෂිකාර්මික අපනයන ඉපැයීම්වල වර්ධනයක් දක්නට ලැබුණු අතර, ඛනිජමය අපනයනවල පහළ යෑමක් දක්නට ලැබුණි. 2022 වසරේ ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්ත අපනයන ආදායම, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති එ.ජ. ඩොලර් මිලියන 4,219ට සාපේක්ෂව සියයට 11.0කින් ඉහළ ගියේය.

**කාර්මික අපනයන:** කාර්මික භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී සියයට 21.9කින් ඉහළ ගියේය. කාර්මික භාණ්ඩ බොහොමයක අපනයන ආදායම ඉහළ ගිය අතර, සමස්ත වැඩිවීම සඳහා ඇඟලුම් සහ ඛනිජ තෙල් නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත යන කාණ්ඩවලින් ලැබුණු ඉපැයීම් පහළ යෑමක් වාර්තා විය. ඇඟලුම් අපනයන සම්බන්ධ සියලුම ප්‍රධාන වෙළඳපොළ (එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ එක්සත් රාජධානිය) වෙත සිදු කළ අපනයන වර්ධනය විය. නැව් සහ ගුවන්යානා සඳහා යොදාගනු ලබන ඉන්ධනවල අපනයන මිල ගණන් සහ පරිමාවන් යන දෙඅංශයෙහිම ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම වර්ධනය විය.

**කෘෂිකාර්මික අපනයන:** 2022 වසරේ අප්‍රේල් මාසයේ දී කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයෙන් ලද සමස්ත ආදායම, 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව, සියයට 7.3කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් පොල් (ප්‍රධාන වශයෙන්, පොල් කෙඳි, පොල්තෙල් සහ දිසිදි පොල්) සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, පුවක්, තල ඇට සහ ශාක හා ශාක කොටස්) සහ මුහුදු ආහාර හේතු විය. 2022 වසරේ අප්‍රේල් මාසයේ තේ අපනයන ආදායම සියයට 1.5කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) සුළු වශයෙන් වැඩි වූ අතර, අපනයන මිල ගණන් අඩු වීම මධ්‍යයේ වුවද අපනයනය කරන ලද තේ පරිමාව ඉහළ යෑම මෙම වර්ධනය සඳහා හේතු විය. මේ අතර, සකස් නොකළ දුම්කොළ, කුළුබඩු (ප්‍රධාන වශයෙන්, ගම්මිරිස් සහ කරාබුනැටි) සහ එළවළු අපනයනයෙන් ලද ආදායම 2022 වසරේ අප්‍රේල් මාසයේ දී පහළ යෑම් වාර්තා කළේය.

**ඛනිජ අපනයන:** ප්‍රධාන වශයෙන්, ලෝපස්, ලෝබොර සහ අළු කාණ්ඩය යටතේ වර්ග කරන ලද ටයිටේනියම් ලෝපස් අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ඛනිජ අපනයන ආදායම ආසන්න වශයෙන් අඩක් දක්වා අඩු විය.

**අපනයන දර්ශක:** අපනයන ආදායම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් අපනයන මිල ගණන් ඉහළ යෑම හේතු වූ බව නිරූපණය කරමින්, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, අපනයන පරිමා දර්ශකය සහ ඒකක මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 5.9කින් සහ සියයට 11.2කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගියේය.

[1] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් අපනයන සංයුතිය ඇමුණුම Iහි දක්වා ඇත.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරීත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: මාසික අපනයන ඒකක මිල දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2021 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2022 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **647.1** | **789.0** | **21.9** | **2,949.4** | **3,416.9** | **15.8** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 35.0 | 41.1 | 17.2 | 167.4 | 179.8 | 7.4 |
| සත්ත්ව ආහාර | 9.3 | 11.0 | 18.4 | 38.9 | 46.6 | 19.9 |
| රෙදිපිළි හා ඇඟලුම් | 366.0 | 447.7 | 22.3 | 1,699.5 | 1,924.6 | 13.2 |
| එයින්, ඇඟලුම් | 336.9 | 409.3 | 21.5 | 1,556.0 | 1,769.9 | 13.7 |
| රෙදිපිළි | 20.6 | 28.2 | 37.0 | 98.9 | 112.2 | 13.3 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 8.5 | 10.2 | 19.7 | 44.5 | 42.6 | -4.3 |
| රබර් නිෂ්පාදිත | 61.6 | 68.1 | 10.7 | 317.9 | 319.8 | 0.6 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.2 | 25.5 | 5.2 | 95.0 | 119.1 | 25.4 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 31.0 | 40.7 | 31.1 | 156.0 | 174.5 | 11.8 |
| ප්‍රවාහන උපකරණ | 7.4 | 10.0 | 36.5 | 34.1 | 44.0 | 29.2 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 36.3 | 58.5 | 61.2 | 122.1 | 238.0 | 94.9 |
| රසායනික නිෂ්පාදිත | 15.3 | 19.4 | 26.6 | 68.3 | 71.6 | 4.9 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 8.4 | 11.6 | 37.4 | 39.7 | 49.2 | 24.0 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 12.3 | 1.0 | -92.0 | 22.1 | 15.6 | -29.3 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 3.8 | 7.6 | 102.1 | 14.9 | 24.6 | 64.9 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.0 | 4.2 | -15.5 | 24.2 | 22.6 | -6.8 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 8.7 | 13.3 | 53.5 | 42.0 | 63.5 | 51.0 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.0 | 2.2 | 5.8 | 11.3 | 10.9 | -3.8 |
| වෙනත් කාර්මික අපනයන | 20.8 | 27.3 | 31.2 | 96.2 | 112.6 | 17.1 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **165.6** | **177.7** | **7.3** | **829.4** | **783.5** | **-5.5** |
| තේ | 79.3 | 80.4 | 1.5 | 417.4 | 367.2 | -12.0 |
| රබර් | 3.2 | 3.1 | -1.2 | 15.4 | 17.8 | 15.6 |
| පොල් | 27.3 | 34.0 | 24.5 | 123.6 | 138.8 | 12.2 |
| කුළුබඩු | 22.4 | 21.4 | -4.2 | 136.2 | 106.8 | -21.6 |
| එළවළු | 1.9 | 1.7 | -9.7 | 8.4 | 7.7 | -8.5 |
| සකස් නොකළ දුම්කොළ | 2.7 | 0.9 | -68.3 | 11.3 | 8.0 | -29.1 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.7 | 14.8 | 52.8 | 41.6 | 48.4 | 16.3 |
| මුහුදු ආහාර | 19.2 | 21.2 | 10.6 | 75.6 | 88.9 | 17.7 |
| **3. ඛනිජ අපනයන** | **4.2** | **1.9** | **-54.2** | **16.0** | **12.3** | **-22.8** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.3** | **1.2** | **-10.4** | **5.6** | **6.4** | **14.3** |
| **මුළු අපනයන** | **818.2** | **969.8** | **18.5** | **3,800.3** | **4,219.1** | **11.0** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ අප්‍රේල් මාසයේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,707ට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,699ක් දක්වා සියයට 0.5කින් සුළු වශයෙන් පහළ ගියේය.** ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා දරන ලද වියදමෙහි පහළ යෑමක් නිරීක්ෂණය වූ අතර, ආහාර සහ අන්තර් භාණ්ඩ ආනයනයෙහි ඉහළ යෑමක් වාර්තා විය. හදිසි නොවන භාණ්ඩ ආනයනය සඳහා රජය විසින් පනවන ලද ආනයන සීමා සහ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම මෙම පහත වැටීම සඳහා දායක වූ බවට සැලකිය හැකිය. සමුච්චිත පදනම මත, 2022 වසරේ ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්ත ආනයන වියදම, එ.ජ. ඩොලර් මිලියන 7,350ක් වූ අතර, එය සියයට 8.9ක (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) වර්ධනයක් විය.

**පාරිභෝගික භාණ්ඩ:** ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන සියයට 43.4කින් පහළ යෑම හේතුවෙන්, 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 15.4කින් අඩු විය. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමෙහි අඩුවීම සමස්තයක් වශයෙන් සිදු වුවද විදුලි සංදේශ උපකරණ (ප්‍රධාන වශයෙන්, ජංගම දුරකථන), ගෘහ උපකරණ (ප්‍රධාන වශයෙන්, රූපවාහිනී) සහ බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ඖෂධ) ආනයනය පහත වැටීම කැපී පෙනේ. කෙසේ වෙතත්, රෙදිපිළි හා උපාංග සඳහා වන වියදම්වල සුළු වැඩිවීමක් වාර්තා විය. මේ අතර, ප්‍රධාන වශයෙන් කොටන ලද සහල් ආනයනය සඳහා වන වියදම ඉහළ යෑම හේතුවෙන් ආහාර සහ පාන වර්ග ආනයන වියදම සියයට 19.8කින් ඉහළ ගියේය. තවද, කිරි නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, කිරිපිටි) සහ එළවළු (ප්‍රධාන වශයෙන්, සුදුළූණු සහ කොණ්ඩකඩල) ආනයන වියදමෙහි සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය විය. පාන වර්ග (මත්පැන් සහ වෙනත් පාන වර්ග) ආනයනය සඳහා වන වියදම ද යම් ප්‍රමාණයකට ඉහළ ගියේය. කෙසේ වෙතත්, සීනි ආනයන වියදම 2022 වසරේ අප්‍රේල් මාසයේ දී සියයට 35.6කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහළ ගිය අතර, ඒ සමඟම තෙල් සහ මේද වර්ග, පලතුරු, මුහුදු ආහාර සහ කුළුබඩු ආනයන වියදම ද පහළ යන ලදී.

**අන්තර් භාණ්ඩ:** 2022 වසරේ අප්‍රේල් මාසයේ අන්තර් භාණ්ඩ ආනයන වියදම වසරකට පෙර පැවති අගය හා සැසඳීමේ දී, සියයට 11.3කින් ඉහළ ගිය අතර ඉන්ධන සහ රෙදිපිළි උපාංග ආනයනය ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. බොරතෙල් ආනයනය නොකළ ද, ඉන්ධන ආනයන සාමාන්‍ය මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඉන්ධන (පිරිපහදු කළ ඛනිජ තෙල් හා ගල් අඟුරු ඇතුළත් වන) ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 510ක අගයක් වාර්තා කරමින් සියයට 23.5කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගියේය. ආනයන වියදම ඉහළ යෑමක් වාර්තා කළ අන්තර් භාණ්ඩ කාණ්ඩ අතර කෘෂිකාර්මික යෙදවුම් (ප්‍රධාන වශයෙන්, සත්ත්ව ආහාර), රසායනික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, වාෂ්පශීලී තෙල් වර්ග), ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, එතිලීන් බහුඅවයවික, සහ ප්ලාස්ටික් පිඟන් හා තහඩු), ආහාර සැකසුම් (ප්‍රධාන වශයෙන්, මෝල්ට් සාරය හා ද්‍රවමය මාජරින්), කඩදාසි සහ ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත

---

[2] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් ආනයන සංයුතිය ඇමුණුම IIහි දක්වා ඇත.

.

නිෂ්පාදිත, ඛනිජ නිෂ්පාදිත, දියමන්ති, වටිනා ගල් සහ ලෝහ, සහ සකස් නොකළ දුම්කොළ නිෂ්පාදිත ඇතුළත් විය. කෙසේ වෙතත්, පොහොර, මූල ලෝහ, රථවාහන හා යන්ත්‍රෝපකරණ කොටස්, තිරිඟු සහ රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ඇතුළු ඇතැම් ආනයනික අන්තර් භාණ්ඩ වර්ග පහළ යෑමක් පෙන්නුම් කළේය.

**ආයෝජන භාණ්ඩ:** 2021 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සියයට 24.6කින් පහළ ගියේය. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන ප්‍රධාන ආයෝජන භාණ්ඩ ත්‍රිත්වය යටතේ ලැයිස්තුගත කර ඇති සියලුම ආනයන භාණ්ඩ වර්ග සියල්ලම පාහේ පහළ යෑමක් වාර්තා කළේය. ඉංජිනේරු උපකරණ, යකඩ හා වානේ උපාංග, ඉලෙක්ට්‍රොනික උපකරණ, විදුලි මෝටර් සහ ජනක යන්ත්‍ර කට්ටල ආශ්‍රිත ආනයන වියදම්වල යම් වැඩිවීම් නිරීක්ෂණය විය.

**ආනයන දර්ශක:** 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ආනයන වියදම සුළු වශයෙන් පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආනයන පරිමාව හේතු වූ බව නිරූපණය කරමින් ආනයන පරිමා දර්ශකය සියයට 20.0කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 24.4කින් ඉහළ ගියේය.

**රූප සටහන 7: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 8: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 9: මාසික ආනයන ඒකක මිල දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2021 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2022 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **278.6** | **235.8** | **-15.4** | **1,276.5** | **1,176.6** | **-7.8** |
| ආහාර හා පාන වර්ග | 123.5 | 148.0 | 19.8 | 628.8 | 660.6 | 5.0 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.4 | 29.9 | 792.4 | 12.8 | 167.8 | 1,210.6 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 24.8 | 33.9 | 36.9 | 114.9 | 116.8 | 1.7 |
| එළවළු (ආ) | 26.9 | 32.2 | 19.4 | 138.0 | 122.8 | -11.0 |
| මුහුදු ආහාර | 8.4 | 7.1 | -15.9 | 33.1 | 30.0 | -9.4 |
| සීනි හා රසකැවිලි | 30.0 | 19.3 | -35.5 | 167.4 | 85.8 | -48.7 |
| කුළුබඩු | 9.8 | 8.9 | -9.0 | 47.5 | 50.5 | 6.4 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 20.3 | 16.8 | -17.4 | 115.2 | 86.9 | -24.6 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 155.1 | 87.7 | -43.4 | 647.7 | 516.0 | -20.3 |
| පෞද්ගලික රථවාහන | 1.1 | 0.6 | -48.5 | 3.5 | 2.7 | -25.1 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 48.6 | 32.8 | -32.4 | 192.3 | 199.2 | 3.6 |
| ගෘහ උපකරණ | 26.4 | 4.5 | -82.9 | 97.6 | 50.8 | -48.0 |
| රෙදිපිළි හා උපාංග | 19.2 | 21.9 | 14.0 | 74.9 | 93.9 | 25.3 |
| විදුලි සංදේශ උපකරණ | 27.2 | 4.7 | -82.7 | 137.0 | 40.2 | -70.6 |
| ගෘහ හා දැව භාණ්ඩ | 10.7 | 8.4 | -21.0 | 53.5 | 56.5 | 5.5 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 21.9 | 14.8 | -32.3 | 88.7 | 72.8 | -17.9 |
| **2. අන්තර් භාණ්ඩ** | **1,075.0** | **1,196.6** | **11.3** | **4,065.7** | **4,806.6** | **18.2** |
| ඉන්ධන | 413.2 | 510.1 | 23.5 | 1,390.3 | 1,922.4 | 38.3 |
| එයින්, බොරතෙල් | 97.1 | - | - | 224.2 | 110.1 | -50.9 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 286.1 | 476.5 | 66.5 | 1,039.6 | 1,556.4 | 49.7 |
| ගල්අඟුරු | 29.9 | 33.6 | 12.4 | 126.5 | 256.0 | 102.3 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 7.0 | 8.2 | 16.6 | 43.5 | 57.0 | 31.3 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 228.4 | 281.2 | 23.1 | 938.6 | 1,161.7 | 23.8 |
| කඩදාසි හා ඝන කඩදාසි | 41.0 | 44.2 | 7.8 | 146.8 | 166.4 | 13.4 |
| කෘෂිකාර්මික යෙදවුම් | 19.1 | 25.2 | 32.4 | 86.6 | 82.1 | -5.1 |
| තිරිඟු හා ඉරිඟු | 26.7 | 21.0 | -21.6 | 120.2 | 102.7 | -14.6 |
| මූල ලෝහ | 40.7 | 22.4 | -45.0 | 194.2 | 200.2 | 3.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 57.1 | 61.7 | 8.1 | 257.8 | 269.7 | 4.6 |
| රසායනික නිෂ්පාදිත | 90.0 | 95.7 | 6.3 | 364.6 | 362.2 | -0.7 |
| පොහොර | 47.3 | 20.5 | -56.6 | 82.2 | 42.1 | -48.9 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 32.4 | 30.4 | -6.1 | 133.4 | 127.4 | -4.5 |
| ඛනිජ නිෂ්පාදිත | 16.8 | 18.6 | 11.2 | 44.5 | 64.5 | 44.9 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 55.4 | 57.3 | 3.5 | 263.0 | 248.1 | -5.7 |
| **3. ආයෝජන භාණ්ඩ** | **353.0** | **266.3** | **-24.6** | **1,403.1** | **1,365.2** | **-2.7** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 227.9 | 179.6 | -21.2 | 913.0 | 874.8 | -4.2 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 98.1 | 75.6 | -22.9 | 381.8 | 417.4 | 9.3 |
| ප්‍රවාහන උපකරණ | 26.8 | 10.7 | -60.0 | 107.7 | 71.2 | -33.9 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.1 | 0.4 | 209.1 | 0.6 | 1.8 | 187.7 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.3** | **0.3** | **-20.2** | **2.8** | **1.8** | **-34.6** |
| **මුළු ආනයන** | **1,707.0** | **1,699.0** | **-0.5** | **6,748.1** | **7,350.2** | **8.9** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,293.8** | **1,188.8** | **-8.1** | **5,357.8** | **5,427.8** | **1.3** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** 2022 වසරේ මාර්තු මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 318ක් සහ පෙර වසරේ අප්‍රේල් මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 519ට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 249ක් විය. නුපුහුණු (7,327), පුහුණු (6,437) සහ ගෘහ සේවිකා (5,398) යන කාණ්ඩවල දායකත්වයෙන්, 2022 වසරේ අප්‍රේල් මාසය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සමස්තය 22,148ක් ලෙස වාර්තා විය. එබැවින්, 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සමස්තය 91,563ක් ලෙස වාර්තා විය.

**සංචාරක පැමිණීම්:** 2022 වසරේ මාර්තු මාසයේ වාර්තා වූ 106,500ක සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී පැමිණි සංචාරකයන් ප්‍රමාණය 62,980ක් ලෙස වාර්තා විය. 2022 වසරේ අප්‍රේල් මාසය තුළ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි රටවල් ලෙස එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය, ප්‍රංශය සහ රුසියාව පැවතුණි. 2022 වසරේ මාර්තු මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 192ක් සහ පෙර වසරේ අප්‍රේල් මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 11ට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 113ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 10: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 11: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූලය ලැබීම්

2022 වසරේ අප්‍රේල් මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන සුළු ශුද්ධ ලැබීමක් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ අප්‍රේල් මාසය දක්වා වූ මාස හතර තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 4ක සමස්ත ශුද්ධ ලැබීමක් විය. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 2ක ශුද්ධ ලැබීමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, 2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසන් වූ මාස හතර තුළ දී ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 92ක විදේශීය ආයෝජන ශුද්ධ ලැබීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

2022 වසරේ අප්‍රේල් මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 1.8ක් විය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.5කට සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීම යම් කොන්දේසි වලට යටත් වේ. දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම් වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2022 වසරේ අප්‍රේල් මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 5.3ක් විය.

**රූප සටහන 12: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**සමපේක්ෂනය නිසා ඇතිවූ විනිමය අනුපාතිකයේ ඉහළ විචලනයන් සීමා කිරීම අරමුණින් 2022 වසරේ මැයි 13 වැනි දින සිට හඳුන්වා දුන් නව විනිමය අනුපාතික සැකැස්ම හේතුවෙන් විනිමය අනුපාතිකයේ ස්ථාවර වීමක් නිරීක්ෂණය විය.** ඒ අනුව, 2022 වසරේ මැයි 13 සිට මේ දක්වා, ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සුළු අතිප්‍රමාණය වීමක් වාර්තා කර ඇති අතර, 2022 වසර තුළ මේ දක්වා එය එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 44.3 ක අවප්‍රමාණයක් වාර්තා කර ඇත. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වල හැසිරීම පිළිබිඹු කරමින්, 2022 වසරේ ජූනි 10වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඕස්ට්‍රේලියානු ඩොලරයට සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය විය.

**රූප සටහන 13: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම**

| මුදල් ඒකකය | 2020 | 2021 | 2022 (ජූනි 10 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.6% | -7.0% | -44.3% |
| යූරෝ | -11.2% | +1.1% | -40.7% |
| ස්ටර්ලින් පවුම | -6.2% | -6.0% | -39.8% |
| ජපන් යෙන් | -7.5% | +3.8% | -35.1% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -11.4% | -1.2% | -43.1% |
| ඉන්දියානු රුපියල | 0.0% | -5.5% | -41.7% |

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම I:**

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | 2021 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2022 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **172.0** | **183.4** | **6.7** | **847.9** | **816.3** | **-3.7** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 22.3 | 23.8 | 6.8 | 87.0 | 101.4 | 16.5 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 3.0 | 6.0 | 97.3 | 21.6 | 24.0 | 11.4 |
| 05 එළවළු හා පලතුරු | 33.0 | 38.3 | 16.2 | 137.6 | 150.4 | 9.3 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 100.6 | 99.8 | -0.8 | 544.1 | 469.5 | -13.7 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **8.7** | **9.6** | **10.5** | **42.2** | **42.9** | **1.6** |
| 11 පාන වර්ග | 2.3 | 4.0 | 77.3 | 9.5 | 13.6 | 42.7 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 6.4 | 5.6 | -13.0 | 32.7 | 29.3 | -10.3 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **29.7** | **35.6** | **19.8** | **140.3** | **156.6** | **11.6** |
| 23 සකස් නොකළ රබර් | 3.3 | 3.2 | -0.7 | 15.7 | 18.3 | 16.1 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 15.4 | 20.0 | 29.9 | 75.5 | 82.8 | 9.7 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **36.3** | **58.5** | **61.2** | **122.1** | **238.0** | **94.9** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 36.3 | 58.5 | 61.2 | 122.1 | 222.1 | 81.9 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | - | - | - | 15.9 | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **8.2** | **9.0** | **9.5** | **38.0** | **34.3** | **-9.5** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 5.3 | 7.4 | 41.3 | 23.6 | 25.2 | 6.6 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **17.6** | **23.5** | **33.1** | **84.9** | **87.6** | **3.1** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **105.0** | **129.6** | **23.5** | **512.2** | **587.1** | **14.6** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 38.2 | 46.3 | 21.2 | 202.4 | 219.6 | 8.5 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 28.0 | 35.6 | 27.2 | 135.9 | 146.2 | 7.6 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 26.6 | 29.7 | 11.9 | 113.0 | 138.1 | 22.2 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **37.0** | **49.0** | **32.5** | **185.1** | **212.4** | **14.7** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 20.9 | 26.6 | 27.3 | 99.2 | 109.4 | 10.3 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **403.7** | **471.3** | **16.7** | **1,827.4** | **2,043.2** | **11.8** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 362.4 | 434.4 | 19.9 | 1,681.3 | 1,882.1 | 11.9 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **-** | **0.3** | **-** | **0.2** | **0.6** | **218.5** |
| **මුළු අපනයන** | **818.2** | **969.8** | **18.5** | **3,800.3** | **4,219.1** | **11.0** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම II:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | 2021 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2022 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **ර0. ආහාර හා සජීවී සතුන්** | **169.8** | **201.2** | **18.5** | **806.9** | **852.0** | **5.6** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 24.8 | 33.9 | 36.7 | 115.1 | 117.0 | 1.7 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 8.5 | 7.2 | -14.5 | 33.5 | 30.5 | -8.9 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 30.1 | 50.3 | 66.7 | 132.0 | 268.6 | 103.4 |
| 05 එළවළු හා පලතුරු | 34.0 | 36.7 | 8.1 | 166.2 | 149.8 | -9.9 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 30.0 | 19.3 | -35.5 | 167.4 | 85.8 | -48.7 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 12.9 | 12.8 | -0.9 | 62.1 | 66.8 | 7.5 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **4.7** | **6.8** | **46.4** | **23.2** | **32.3** | **39.1** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **47.6** | **45.7** | **-4.0** | **190.9** | **186.8** | **-2.1** |
| 23 සකස් නොකළ රබර් | 28.4 | 26.4 | -7.2 | 117.6 | 107.5 | -8.6 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 1.6 | 3.3 | 109.3 | 7.5 | 10.3 | 37.3 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **413.2** | **510.1** | **23.5** | **1,390.3** | **1,922.4** | **38.3** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 356.7 | 459.0 | 28.7 | 1,145.0 | 1,579.5 | 37.9 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 26.5 | 17.4 | -34.4 | 118.8 | 87.0 | -26.8 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **11.0** | **8.2** | **-25.0** | **104.2** | **45.1** | **-56.7** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 9.9 | 6.6 | -32.7 | 96.2 | 36.8 | -61.7 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **239.0** | **205.7** | **-14.0** | **883.2** | **865.4** | **-2.0** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 42.8 | 29.9 | -30.1 | 169.6 | 186.5 | 9.9 |
| 56 පොහොර | 47.1 | 20.5 | -56.6 | 82.1 | 42.0 | -48.8 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 42.0 | 43.7 | 4.0 | 191.8 | 194.3 | 1.3 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 11.5 | 14.2 | 23.1 | 53.7 | 64.3 | 19.6 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **429.5** | **450.1** | **4.8** | **1,763.3** | **2,077.1** | **17.8** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 38.3 | 41.7 | 8.7 | 139.8 | 155.6 | 11.3 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 222.4 | 275.0 | 23.6 | 922.8 | 1,141.2 | 23.7 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 41.4 | 38.7 | -6.6 | 163.9 | 205.5 | 25.4 |
| 67 යකඩ හා වානේ | 47.7 | 26.6 | -44.3 | 232.1 | 267.1 | 15.1 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **314.5** | **202.0** | **-35.8** | **1,276.9** | **1,051.9** | **-17.6** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 53.5 | 34.0 | -36.5 | 213.7 | 199.4 | -6.7 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 55.9 | 54.2 | -3.1 | 209.5 | 205.9 | -1.7 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 24.8 | 11.1 | -55.3 | 110.8 | 83.2 | -24.9 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 59.7 | 19.1 | -68.0 | 262.7 | 126.9 | -51.7 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 56.1 | 46.3 | -17.4 | 242.6 | 246.6 | 1.7 |
| 78 රථවාහන | 31.9 | 14.5 | -54.7 | 119.6 | 71.0 | -40.7 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **77.1** | **68.9** | **-10.6** | **305.9** | **314.3** | **2.7** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 16.3 | 20.3 | 25.0 | 61.6 | 81.1 | 31.7 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 18.5 | 11.2 | -39.1 | 72.6 | 58.5 | -19.4 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.6** | **0.3** | **-47.0** | **3.3** | **2.9** | **-13.2** |
| **මුළු ආනයන** | **1,706.9** | **1,699.0** | **-0.5** | **6,748.0** | **7,350.1** | **8.9** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf